අධ්‍යාපන අමාත්‍යාංශය

දිවයිනේ රජයේ පාසල්වල පවතින පුරප්පාඩු සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් බඳවා ගැනීම - 2017

දිවයිනේ රජයේ පාසල්වල පවතින පුරප්පාඩු සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. යෝග්‍යතා :-

1.1 සාමාන්‍ය සුදුසුකම්

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

II. යහපත් චරිතයකින් පෙන මිනස්සු හා සාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

III. 2017.06.15 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

IV. අයදුම්කරු විනිශ්චිත චරිතයකින් යුක්ත විය යුතුය.

1.2 අධ්‍යාපන සුදුසුකම්

දෙවරකට නොවැඩි වාර ගණනකදී අවසාන (සා. පෙළ) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව ඇතුළු විෂයයන් තයකින් (06) සමත් වී තිබිය යුතුය.

1.2.1 වෘත්තීය සුදුසුකම්

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරගයකදී අවම වශයෙන් 3 වන ස්ථානය (තෙවන) ලබාගැනීම.

හෝ

ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වන ජාතික මොහා ක්‍රීඩා උළෙලේදී අවම වශයෙන් 3 වන ස්ථානය (තෙවන) ලබා තිබීම.

හෝ

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පවත්වන පළාත් ක්‍රීඩා තරගවලදී අවම වශයෙන් 2 වන ස්ථානය (දෙවන) ලබා තිබීම.

හෝ

ක්‍රීඩා පන්ත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගමය හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සංගම මගින් පවත්වන ජාතික මට්ටමේ තරගයක්හි දී (පළාත් මට්ටම/ දිස්ත්‍රික් මට්ටම නැත) අවම වශයෙන් 3 ස්ථානය (තෙවන) ලබා තිබීම.

හෝ

ජාතික මිනෙහට බලපෑමේ බලපෑම/ බලිතා ගුධ, ඉඳුන්, හාවුක, පොලිත් හා ඇරිය වාදක අංශයන්හි මිනෙහට සැරයන් නිලධාරියෙකු/ නිලධාරිණියක වීම.

2. බඳවා ගැනීමේ ක්‍රමය හා සේවා කොන්දේසි

2.1 අධ්‍යාපන ලේඛනමි විසින් නියම කරනු ලබන පරිදි ඔහු විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල මගින් ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන අතර එමගින් ලබාගන්නා ඉල් ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව අනුව පාසල් සඳහා ක්‍රමය පදනම් කරගෙන, පවතින ක්‍රීඩා පුහුණුකරු, පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීමට සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් තොමැති අයදුම්කරුවන් පළමු සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.2 මෙම ශ්‍රැසට නිවේදනයට අදාළ පුරප්පාඩු ඩැඩ්පුර පවතින්නේ නගරාශ්‍රිත ප්‍රදේශවලින් ඈතර ඉන්දෙර පාසල්වලය. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අයදුම්කරුවන්ට අදාළ පුරප්පාඩු ප්‍රදේශය ප්‍රදර්ශනය කරනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් විසින් එම අවස්ථාවේදී පුරප්පාඩු පවතින පාසල් සඳහා ස්ථානීය පත්වීම් ලබාගැනීමට ඇති කොපය අනුපිළිවෙලින් දක්විය යුතුය.

2.3 මෙම පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන්නේ පාසල් සඳහ ක්‍රමය පදනම් කර ගෙන වන ඔබින් වසර 08 ක් යන වන තුරු කිසිදු අලුත්කීම් ස්ථාන මාරුවීම් ලබාදෙනු නොලැබේ.

2.4 මේ වන විට දිවයිනෙහි රජයේ පාසල්වල පවතින සිංහල හා දෙමළ මාධ්‍ය ක්‍රීඩා පුහුණුකරු පුරප්පාඩු 3868 ක (තුන්දහස් අටසිය හැට අටක්) පුම්ණයක් පවතින අතර බඳවා ගන්නා අවස්ථාවේදී පද්ධතිය තුළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සහ සේවා අවශ්‍යතාව මත බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

2.5 පුරප්පාඩු සංඛ්‍යාවෙන් 20% ක් තාත්තා නිලධාරීයන් සඳහා වෙන් කරනු ඇත.

සටහන

සම්මුඛ පරීක්ෂණයේදී එකම පාසලට ඉල්ලා ඇති ඉල්ලුම්කරුවන් කිහිප දෙනෙකු සමාන ලකුණු ලබා තිබෙන අවස්ථාවක අයදුම්කරුගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට එම පාසලට ඇති දුර ප්‍රමාණය අනුව ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ. එම තීරණයක මත පුදුසුකම් ලබන අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කරනු ඇත.

2.6 රජයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද MN-1 බඳවා ගැනීම පරිපාටිය මගින් පනවා ඇති කොන්දේසිවලට ද එම පරිපාටියෙහි කිත් ඉදිරියට කෙරෙන සංශෝධනවලට යටත්ව කෝරාගනු ලබන අයදුම්කරුවන් ක්‍රීඩා පුහුණුකරු තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ. 2016.02.23 දිනැති රාජප පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය වන MN-1A 2016 දරන වැටුප් තාණ්ඩය (27,140 - 300 X 10 - 350 X 11 - 495 X 10 - 660 X 10 - 45,640 ක්) වේ.

2.7 මෙම පත්වීම ස්ථිරය විමාන වැටුප් සහිතය.

සටහන

විමාන වැටුප් සහිත බව ඉදිරියේදී රජය ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව වෙනස් වේ.

2.8 අධ්‍යාපන අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාත්වණික සෙවන බණ්ඩය - 02 සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන බඳවා ගැනීම පරිපාටියේ විධිවිධාන අනුව බඳවා ගැනීම හා උසස් වීම් සිදු කරනු ලැබේ. එමෙන්ම මෙම ශ්‍රැසට නිවේදනයෙන් ආවරණය නොවන යම් කරුණක් වෙතොත් එය අධ්‍යාපන අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාත්වණික සෙවන බණ්ඩය -02 සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන බඳවා ගැනීම පරිපාටියේ විධිවිධානයන්හි සඳහන් විධිවිධානවලට යටත් වනු ඇත.

03. අයදුම් කිරීමේ ක්‍රමය

3.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත තාවිතා කරමින් කතක් කර අයදුම්කරු විසින්ම පිරවිය යුතුය. 1.0 සිට 3.4 දක්වා වන කීරිය පළමු වන පිටුවේ ද 6.0 සිට 6.3 දක්වා වන කීරිය දෙවන පිටුවේ ද 7.0 සිට 8.0 දක්වා කොටස පිටුවට ද වන පරිදි තම අයදුම්පත්‍රය සතක් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර අසම්පූර්ණ ලෙස තෝරාගැනී සඳහන් කර ඇති අයදුම්පත්‍ර ද දැනුම දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පුවත්පත් නිවේදනයේ දක්වන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර අයදුම්පත සමග ඇමුණුම් කිසිවක් නොවන ලෙස ද දක්වා පිටමි. ඇමුණුම් සහිතව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.2 එක් අපේක්ෂකයකු ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණි.

3.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුලුයන විද්‍යුත්තාපීඩරයකු/ සාමාන්‍ය විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ කීර්තිවැවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ශ්‍රීමාන් සමුදාවේ අධිකාරී මලයලන් නිලධාරියෙකු / පොලිස් සේවයේ ඉහළ කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 498,000/- කට වැඩි මූල්‍ය වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කර තිබිය යුතුය.

3.4 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2017.06.15 දිනට හෝ ඊට පෙර ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉපුරුප්පාය, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් මෙහි එවනු ලබන කවරය පහත ආකාරයෙන් සකස් කර එවිය යුතුය. එසේ සඳහන් නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය.

"රජයේ පාසල් ක්‍රීඩා පුහුණුකරුවන් බඳවා ගැනීම - 2017"
මාධ්‍යය - සිංහල/ දෙමළ / ඉංග්‍රීසි
දිස්ත්‍රික්කය - .....

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉපුරුප්පාය, බත්තරමුල්ල.

3.5 ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තෝරාගැනී සඳහන් කර ඇති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම්පත්‍ර නැති වීම හෝ පුමාද වීම හෝ ඉතා කිසිම සැමිණිල්ලක් පලතා බලනු නොලැබේ.

3.6 අයදුම්පත් ලැබ ඇති බව දක්වනු නොලැබේ.

04. දකුට රජයේ සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 7.0 කීරිය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

05. සම්මුඛ පරීක්ෂණය සඳහා කියමින දිනයේ දී සහතික නොවන අයදුම්කරුවන් පිළිබඳ කිසිදු අදහසක් තැවත සලකා බලනු නොලැබේ.

06. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට පියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලැබේ.

07. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අධිකාරිය ද කිසියම් පුරප්පාඩුවලින් නොවනක් හෝ ඉල්ලෙන්නේ නිරවිත හෝ නොනිරවිත හෝ පිළිබඳව අවසන් තීරණය කැබිමේ අධිකාරිය ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

08. සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ පදනා කටයුතු කරනු ලැබේ.

09. වැඩි විස්තර www.moe.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

2017.05.22 වැනිදා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉපුරුප්පාය, පැලවත්ත, බත්තරමුල්ල.

සුමිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අධ්‍යාපන අමාත්‍යාංශය

දිවයිනේ රජයේ පාසල්වල පවතින පුරප්පාඩු සඳහා ක්‍රීඩා පුහුණුකරුවන් බඳවා ගැනීම - 2017

ඉල්ලුම්කරන භාෂා මාධ්‍ය

01. ජාතික හැඳුනුම්පත් අංකය :-

02. 2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා :- AMARAKOON MUDIYANSELAGE NAMAL HERATH)

2.2 අංශක යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා, නම (උදා :- HERATH . A.M.N)

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :-

03. විත්තමණ ලිපිනය :-

(සම්මුඛ පරීක්ෂණය සඳහා තැපෑලේ ලිපිය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

04. දුරකථන අංකය : නිවස - ..... කාර්යාලය - .....

05. 5.1 විවාහක / අවිවාහක බව : අවිවාහක - 1 විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.2 උපන් දිනය : වර්ෂය | මාසය | දිනය

5.3 2017.04.01 දිනට වයස : අවු | මාස | දින

5.4 ස්ත්‍රී/ පුරුෂ භාවය : (ස්ත්‍රී -1 / පුරුෂ - 0) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර :

6.1 අ.පො.ස (සා. පෙළ) විභාගය
වර්ෂය : ..... වර්ෂය : .....
විභාග අංකය : ..... විභාග අංකය : .....

අනු අංකය	විෂය	සාමාර්ථය
01		
02		
03		
04		
05		
06		
07		
08		
09		
10		

අනු අංකය	විෂය	සාමාර්ථය
01		
02		
03		
04		
05		
06		
07		
08		
09		
10		

6.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය
වර්ෂ : ..... විභාග අංකය : .....

අනු අංකය	විෂය	සාමාර්ථය
01		
02		
03		
04		

6.3 වෙනත් අධ්‍යාපන සුදුසුකම් : .....

07. ක්‍රීඩා සුදුසුකම්

වර්ෂය	සහභාගි වූ තරගය	සහභාගි වූ ඉසව්ව	ලබාගත් ස්ථානය

(ලබාගත් ඉහළම ජයග්‍රහණය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න)

මෙහි සඳහන් කර ඇති තොරතුරු, මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබුවොත් පසුව කුසලතා බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තොදැනගැනීම දන්නා බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි. බඳවා ගැනීම සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම් විසින් පනවනු ලබන කිසි රීතිවලට යටත් වන බවද ප්‍රකාශ කරමි.

....
දිනය අයදුම්කරුගේ අත්සන

08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මගින / මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව සඳහන බවද, ඔහු/ ඇය මා ඉදිරිපිට දී ..... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.
දිනය : .....

.....
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .....
තනතුර : .....
ලිපිනය : .....
.....

09. අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය
..... මහත්මා/ මහත්මිය/ මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ / ඇය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයකු/ සේවකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

.....
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරලා ලැබූ නිලධාරියා

දිනය : .....
තනතුර : .....
අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව : .....
(නිල මුද්‍රාවෙන් සහතික කරන්න)

වර්ෂ 2017 ක්වූ මැයි මස 22 වැනිදා සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

Source: Dinamina, Daily News (2017.05.22)